# අතීතාවර්ජනය

## ශ්‍රී බෝධි ධර්මවිජය බෞද්ධ සංවිධානය

ප්‍රථම වරට 2016 මැයි මස 07 දින, කොළඹ 08, පුංචි බොරැල්ල, ශ්‍රී සුමංගලාරාම විහාරස්ථානයේ දී, පූජ්‍ය පාතේගම චන්දරතන හිමි, කඩවත උත්තරානන්ද හිමි ඇතුළු හත් දෙනෙකුගෙන් සමන්විත හමුවක ප්‍රතිඵලයක් වශයෙන් මෙම සංවිධානයේ ආරම්භය සනිටුහන් කළ හැක.

පූජ්‍ය උත්තරානන්ද හිමි විසින්, බුදු සසුනේ පැවැත්ම හා චිරස්ථිතය උදෙසා, භික්ෂූන් වහන්සේට ඉංග්‍රීසි අධ්‍යාපනය හා බුදු දහම ඉගැන්වීමේ අවශ්‍යතාවය හා යෝග්‍යතාවය පැහැදිලි කළ කෙටි අනුශාසනාවක් කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම බෞද්ධ සංවිධානය යථාර්ථයක් බවට පත් විය.

මෙම ආරම්භක අවස්ථාවට පූජ්‍ය පාතේගම චන්දරතන හිමි, පූජ්‍ය කඩවත උත්තරානන්ද හිමි, ඇතුළු ගිහි මහත්ම මහත්මීන් හත් දෙනෙකු සහභාගී වූහ. අනෙක් අය අතර සිරිපාල උක්වත්ත මයා, ඇමරිකන් ජාතික කර්නල් ඇඩම් බාර්බොරිච් මහතා, කොළඹ විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි කථිකාචාර්ය ආචාර්ය හසන්තා අත්තනායක මහත්මිය, ලෙස්ලි පුනාන්දු, නිමල් රත්නපාල, සී.ජී.සී ජයසූරිය මහත්මිය යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.

ප්‍රථමයෙන් සංවිධානයේ නාමය වශයෙන් ''ධම්මදීප ජාත්‍යන්තර බෞද්ධ සංවිධානය" වශයෙන් නම් ක ළද, රජයේ ලියාපදිංචි කිරීමේදී ඇති වූ ගැටලුවක් මත, පසුව ''ශ්‍රී බෝධි ධර්මවිජය බෞද්ධ සංවිධානය" යනුවෙන් නම් කරන්නට යෙදිනි. (Sri Bodhi Dharmawijaya Buddhist Organization)

10-07-2016 දින පවත්වන ලද, මාසික රැස්වීම වන විට සංවිධානයේ සාමාජිකත්වය 28 දක්වා වර්ධනය විය.

19-08-2018 දින පැවති වාර්ෂික සම්මේලනයේ දී පහත සඳහන් නිලධාරී මණ්ඩලය පත්විය.

1) ගරු සභාපති - පූජ්‍ය පාතේගම චන්දරතන හිමි

2) ගරු උපසභාපති - එස්. ඩබ්. වික්‍රමරත්න මහතා

3) ගරු ලේකම් - සිරිපාල උක්වත්ත මහතා

කමිටු සාමාජිකයින් වශයෙන් උපාලි ගමනායක මහතා, ඩබ්. ශීලාමේස මහතා, ඇල්බියන් මහතා, ජයසූරිය මහත්මිය, කල්‍යාණි එදිරිසිංහ මෙනවිය, ඩබ්. ඩී. ඒ. ඩී. සිල්වා මහතා යන මහත්ම මහත්මීන් පත් විය.

11-12-2018 යන දින ලංකා බැංකුවේ ශ්‍රී බෝධි ධර්මවිජය බෞද්ධ සංවිධානය නමින්, බෝරැල්ල ශාඛාවේ ගිණුමක් විවෘත කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කිත්සිරි සමරනායක මහතා විසින් අතුරුගිරිය මැදගොඩලන්ද පුරාණ විහාරස්ථානයේ භාවනා වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන, අවට ප්‍රදේශවාසී සැදැහැතියන් රාශියක් සහභාගී වූ ජනප්‍රිය වැඩසටහනක් විය.

25-12-2018 දින පැවති වාර්ෂික සම්මේලනය, ශ්‍රී ලංකා බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලයේ මහෝපාධ්‍යායන අතිපූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන්, කොළඹ 07 සමස්ත ලංකා බෞද්ධ සම්මේලන ශ්‍රවනාගාරයේ"දී, ආරාධිත අමුත්තන් 300 ක පමණ ගේ සහභාගිත්වයෙන් පැවැත් වින. මෙදින නව වෙබ් අඩවියක් අන්තර්ජාලය තුළ විවෘත කරන ලදී. මෙදින අපගේ ප්‍රථම බෞද්ධ අධ්‍යාපනික ශාසත්‍රීය සඟරාව "Sri Bodhi Dharmavijaya Buddhist Academic Journal" අන්තර්ජාලය හරහා මුදා හරින ලදී.

මෙම සඟරාව, කැලණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය, මහාචාර්ය, විද්වත් පිරිසකගේ ශාස්ත්‍රීය ලිපි හතකින් සමන්විත වූ අතර, පිටු 105 ක ග්‍රන්ථයක් වශයෙන් ද මුද්‍රණය කරන ලදී. මුද්‍රිත වැය බර රුපියල් එක් ලක්ෂ පනස්දාහක් පමණ විය. මින් මුද්‍රිත පිටපත් එක් දහසක් පමණ, දිවයිනේ විවිධ විශ්ව විද්‍යාල, රජයේ පුස්තකාල, ප්‍රධාන විද්‍යාල සහ සැදැහැවන් පිරිසකට නොමිලයේ බෙදා දෙන ලදී.

සරසවි පොත්හල, නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන පොත්හල, දළදා මාලිගා පොත්හල තුළින් මිලදී ගැනීමට ද පහසුකම් සලසන ලදී.

මෙම සඟරාවේ දෙවන වෙළුම (Volume-02) 2020/21 වර්ෂයේදී අන්තර්ජාල වෙබ් අඩවියේ පළකරන ලදී. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ රචනා ලිපි හයකින් සමන්විත වූ මෙම දෙවන කලාපය, මුද්‍රණ පිරිවැය ගැටලු මත මුද්‍රණය නොකරන ලදී. එහෙත් අන්තර්ජාල වෙබ් අඩවිය තුළින් මුදා හරින ලදී.

බෞද්ධ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය අරමුණු කොට ගත්, අප සංවිධානය, ථේරවාදී බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීම කිසියම් දුරකට සාර්ථකත්වයන් ලබා ඇතියි සතුටින් ප්‍රකාශ කළ හැක. මේ අනුව ථේරවාදී බුදු දහමේ චිරස්ථිතිය උදෙසා, ඉතාමත් සාර්ථක ශාස්ත්‍රීය සංග්‍රහයන් ලොවට හඳුන්වා දී ඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ශාස්ත්‍රවේදී උපාධිය හදාරන දේශීය හා විදේශීය විද්‍යාර්ථීන්

ඉලක්ක කරගත්, විශ්ව විද්‍යාල ආචාර්ය, මහාචාර්ය සම්භාවනීය ආචාර්යවරුන් විසින් රචනා කරන ලද, බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ මනෝ විද්‍යාත්මක විෂය පාදක කරගත්, සකසන ලද ශාස්ත්‍රීය ලිපි ඉහළ අගයන් ගෙන තිබුණි.

වර්තමානයේ බොහෝ දෙනා අධ්‍යාපනය යන්නෙන් විග්‍රහ කරනු ලබන්නේ පාසැලෙන්, සරසවියෙන්, වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබන අධ්‍යාපනය වුවද, ඒ තුළ පවතින, සාරධර්ම, ගුණධර්ම හා කුසලතාවයන් කෙනෙක් දුරට පෞරුෂ වර්ධනයට, සමාජයේ යහපැවැත්මට, පුද්ගල දායකත්වයට වැදගත් වන්නේ ද යන්න, තරයේ විමසා බැලිය යුතු කාලයකට අප අද එලබ දී ඇත.

බලන්න, අද නේපාලනයේ සිදුවී ඇති ඛේදවාචකය. බුදුන් වහන්සේ උපන් දේශය වූ නේපාලයේ, මෙවැනි ඛේදවාචකයන් කිසිසේත් අපේක්ෂා කළ නොහැක්කෙකි. බෞද්ධ දර්ශනය මැනවින් සමාජගත වූවානම්, මෙවැන්නක් සිදු නොවන්නකි. සිදු නොවිය යුත්තකි. මෙවැනි අර්බුද, ඛේදවාචක, ගැටලු, සමාජ ප්‍රශ්න ඇතිවීමට හේතු මුල වූ කාරණා විමසා බලන විට පෙනී යන්නේ, වර්තමාන තරුණ පරපුර, බුදුදහමේ දැක්වෙන සාරධර්ම, ගුණධර්ම වලින් ඈත් වී ඇති බවකි. ඉවත් වෙමින් පවතින තත්ත්වයකි.

මෙවැනි සමාජ තත්ත්වයන් තුළ ''ශ්‍රී බෝධි ධර්මවිජය බෞද්ධ සංවිධානය" ඉටුකරනු ලබන සමාජ මෙහෙවර, සමාජ සත්කාරය ප්‍රශංසනීය තත්ත්වයක් ගෙන ඇත. ඉදිරියට ඉටු කිරීමට ඇති මෙහෙවරද අති විශාලය.

නේපාල රජය විසින් මුහුණු පොත (facebook) ඒ රට තුල තහනම් කිරීම, එරට තරුණ අරගලය හට ගැනීමට මූලික හේතුව බවට වාර්තා වුවද ඊට එහා ගිය හේතු කාරණා රාශියක් තිබිය හැක. මුහුණු පොත තහනමට එරෙහිව නැගී සිටි තරුණ ප්‍රජාව, රජය පෙරළා දමා මහා ඛේදවාචකයක්, විනාශයන් සිදුකොට, රටේ නායකත්වයට පත් කරගනු ලැබ ඇත්තේ, වයස 73 හැවිරිදි, විශ්‍රාමික අගවිනිසුරුවරියක වූ කාන්තාවකි.

මෙයින් පෙනී යන්නේ වර්තමාන තරුණ පරපුර, ජවයෙන් සන්නද්ධ වුවද, සාරධර්ම ගුණධර්මවලින් තොර ප්‍රචණ්ඩකාරී පිරිසක් බවට පත්ව ඇති බව වුවද, බුද්ධිමත් වැඩිහිටි ප්‍රජාවට ඉහළ පිළිගැනීමක් ලැබී ඇත. ලොව පාලනය කරන ප්‍රබල රාජ්‍යයන්හි රාජ්‍ය නායකයන් සියලු දෙනාම වැඩි වශයෙන් වයස 70 - 80 අතර වන බුද්ධිමත් අත්දැකීම් බහුල පුද්ගලයෝ වෙති.

වර්තමානයේ පවතින සමාජ පරිහානිය දෙස බලන විට අප රටේ ද, පෙර නොවී විරූ අන්දමේ ආගමික, සංස්කෘතික පරිහානියක් සිදුවන බව කිව යුතුම කරුණකි. මෙම සමාජ පරිහානියට, අතැම් ප්‍රසිද්ධ චරිත විවෘතව දායකත්වය සපයන බව නොරහසකි. වර්තමානයේ ''බෞද්ධ'' යන නාමය භාවිතයට ද තහංචි පැනවී ඇත. මෙ කරුණ සම්බන්ධයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේට සිදු කිරීමට ඇති කාර්යභාරය, වගකීම අති විශාල වෙයි.

බෞද්ධ සංස්කෘතිය තුළ කිඳා බැස ඇති, සාරධර්ම, ගුණධර්ම, සංස්කෘතීන් ආරක්ෂා කිරීමට හා ඊට එරෙහිව නැගී එන ඇතැම්, දේශීය හා විදේශීය බලවේගයන්ට නොබියව, පෙළ ගැසීමට කාලය එළඹ ඇත.

තම අයහපත් සෞඛ්‍ය තත්ත්වය මධ්‍යයේ වුවද, විවිධ දුෂ්කරතා මධ්‍යයේ, බොහෝ අපහසුකාරී තත්ත්වයන් මත නොපසුබස්නා, දැඩි ආත්ම ශක්තියෙන් යුතුව, මෙම සංවිධානයේ ජීව ගුණය පවත්වා ගැනීම උදෙසා, සංවිධානයේ ගරු සභාපති වහන්සේ වන පූජ්‍ය පාතේගම චන්දරතන හිමියන් ඉටුකරනු ලබන සේවය සම්බන්ධයෙන් අප සංවිධානයේ ගෞරවාදර ප්‍රශංසාව පුදකර සිටිමු.

බුදු දහමේ චිරස්ථිතිය උදෙසා, පැවැත්ම උදෙසා ඒ හිමියන් කරනු ලබන ශාසනික මෙහෙවර අගයන අතර, ඒ හිමියන්ට ත්‍රිවිධ රත්නයේ පිහිටින් නිදුක් නිරෝගී සුවය හා දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමු.

ශ්‍රී බෝධි ධර්ම විජය බෞද්ධ සංවිධානයේ පැවැත්ම වෙනුවෙන් වර්ධනය වෙනුවෙන් මෙතෙක් ආගමනය උදෙසා නන් අයුරින්, විවිධ අන්දමින් උදව් උපකාර කළ, සහයෝගය දුන් සැමට අප සංවිධානයේ ගෞරවාදර ස්තූතිය හා ආශිර්වාදය පුදකර සිටිමු.

ලොවට ලැබුණු සුවිශේෂී වටිනා දායාදයක් වන ''බුදු දහම" මතු පරපුරට ආරක්ෂා කරමින්, ලොවට දායාද කිරීම අපගේ වගකීම විය යුතු බව අපගේ පිළිගැනීමයි. මෙම සත්කාරය සඳහා දායකත්වය සැපයූ, නන් අයුරින් උපකාර කරා වූ ඔබ සැමට ''ශ්‍රී බෝධි ධර්මවිජය බෞද්ධ සංවිධානය" වෙනුවෙන් අපගේ හෘදයාංගම ආශිර්වාදය නැවත වරක් පුදකර සිටිමු.

ඔබ සැමට තෙරුවන් සරණයි.

**සිරිපාල උක්වත්ත**

ලේකම් - ශ්‍රී බෝධි ධර්මවිජය බෞද්ධ සංවිධානය